# 14 අභිවෘද්ධි ආලේපය

ශුද්ධාත්මෙනි //// වස්වාලමින් ඔබේ වරම්
මා ජීවිතේ පුරවන් ඔබේ ආලෝකයෙන් //

පිරිපුන් ප්‍රේමය තුළ වැඩ වසනා ශුද්ධාත්මෙනි,
සත්වරමින් අප පොහොනි කරනු මැන ශුද්ධාත්මෙනි
ඔබ අභිමත අප සැලසුම් කළ මැන
ආලෝකය වී යනෙනා මග දිග

ශුද්ධාත්මෙනි ..........

ජීවිත මග පහද දෙනු මැන සමිඳුනේ;
දිය උල් බව්නුත් ගලවා ගනු මැන සමිඳුනේ
නැණ නුවනින් ඔබ ම වටහා දී
ආලෝකය වී අප දිවි ගමනට

ශුද්ධාත්මෙනි .........



14.1 රූපය - අභිවෘද්ධි ආලේපය



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

සත්‍ය විශ්වාසයේ අප ස්ථිර කොට පූර්ණ ක්‍රිස්තු භක්තිකයන් කිරීම පිණිස ශුද්ධාත්මයාණන් අප වෙත වැඩම කරවන විශේෂ දේව ප්‍රසාද නිධානය අභිවෘද්ධි ආලේපය යි. ප්‍රසාද ස්නාපනයේ දී අප තුළ ජනිත වූ විශ්වාසය පරිණත කරන්නේ අභිවෘද්ධි ආලේපය නමැති දේව ප්‍රසාද නිධානය යි.

## ගැලවීමේ ඉතිහාසය තුළ අභිවෘද්ධි ආලේපය

"ශුද්ධාත්මයාණන් වහන්සේ" යන යෙදුම පුරාණ ගිවිසුමෙහි භාවිත කර නැත. ඒ සඳහා පහත සඳහන් යෙදුම් භාවිත කර ඇත.

- ★ ආත්මානුභාවය

> සමිඳාණන් වහන්සේ වලාකුළකින් බැස, අවුත් මෝසෙස්ට කතා කොට, ඔහු මත වූ ආත්මානුභාවයෙන් කොටසක් ගෙන මූලිකයන් හැත්තෑ දෙනාට දුන් සේක.
> (ගණන් 11:25)

- ★ දේවාත්මානුභාවය

> පොළොව හිස් ව පාළු ව තිබිණි. මහ සයුර මත අන්ධකාරයක් විය. දේවාත්මානුභාවය ජලය මතු පිට හැසුරුණේ ය.
> (උත්පත්ති 1:2)

- ★ ශුද්ධාත්මය

> ඔබ හමුයෙන් මා පලවා නොහැරිය මැනව; ඔබේ ශුද්ධාත්මය මා කෙරෙන් ඉවත් නොකළ මැනව.
> (ගීතාවලිය 51:11)

## ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ

ජේසුස් වහන්සේ පිළිසිඳ ගත්තේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභාවයෙනි.

> දේව දූතයා ඇට (මරිය තුමියට) උත්තර දෙමින්, "ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහළ වන සේක. පරමෝත්තමයාණන්ගේ ආනුභාවය ද ඔබ වසා ගන්නේ ය.
> (ලූක් 1:35)

සමිඳාණන් වහන්සේගේ දූතයෙක් සිහිනයකින් ඔහුට (ජුසේ තුමාට) දර්ශනය වී, "දාවිත්ගේ පුත් ජෝසෙප් ඔබේ බිරිඳ වන මරියා පාවාගන්නට බිය නොවන්න. මන්ද ඇ ගැබ් ගෙන ඇත්තේ ශුද්ධාත්මයාණන් අනුහසිනි.

(මතෙව් 1:20)

දෙවියන් වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේ සීමා රහිත ව ජේසුස් වහන්සේ වෙත දනය කරන සේක. එසේ දානය කිරීමෙන් ජේසුස් වහන්සේට ප්‍රාතිහාර්ය පෑමට ද ධර්මය දේශනා කිරීමට ද ශක්තිය ලැබුණි.

ජේසුස් වහන්සේ බව්තීස්ම-ස්නානය ලැබ, එකෙණෙහි ම දියෙන් ගොඩ ආ සේක. එවිට ස්වර්ගය විවර විය. දෙවියන් වහන්සේගේ ආත්මයාණන් පරෙවියෙකු මෙන් බසිමින් තමන් පිට පැමිණෙනු උන්වහන්සේ දුටු සේක.

(මතෙව් 3:16-17)

තවද, ජොහන් සාක්ෂි දරමින්, "ආත්මයාණන් පරෙවියෙකු මෙන් අහසින් බැස උන්වහන්සේ මත වැඩ හිඳිනු මම දුටිමි; මම උන්වහන්සේ නොහැඳින සිටියෙමි; එහෙත්, වතුරෙන් බව්තීස්ම-ස්නාපනය කරන්ට මා එවා වදළ තැනැත් වහන්සේ ම මට කතා කොට, "ආත්මයාණන් යමෙකු පිට බැස විත් වැඩ හිඳිනු ඔබ දකින්නෙහි ද, ඒ වනාහි ශුද්ධාත්මයාණන්ගෙන් බව්තීස්ම-ස්නාපනය කරන තැනැත් වහන්සේ ය"යි වදළ සේක. ඒ දේ මම ම දිටිමි; දැක, උන්වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ යයි සාක්ෂි දැරුවෙමි"යි කීවේ ය.

(ජොහන් 1:32-34)

දෙවියන් වහන්සේ එවා වදළ තැනැත් වහන්සේ දෙවියන් වහන්සේගේ වදන් පවසන සේක. එසේ වන්නේ දෙවියන් වහන්සේ ශුද්ධාත්මය සීමා රහිත ව දනය කරන බැවිනි.

(ජොහන් 3:34)

## පාස්කු ඉරු දින අපෝස්තුලුවරුන්ට ශුද්ධාත්ම දානය

ජේසුස් වහන්සේ ඔවුන් (අපොස්තුලුවරුන්) පිට හුස්ම හෙළා; ශුද්ධාත්මයාණන් පිළිගන්න.

(ජොහන් 20:22)

පාස්කු ඉරු දින ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපෝස්තුලුවරුන්ට දර්ශනය වී ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ඔවුන් ප්‍රාණවත් කළ සේක. අපට ප්‍රසාද ස්නාපනයේ දී ශුද්ධාත්ම වරම් ලැබෙන ලෙස ඔවුන්ට එදින ශුද්ධාත්ම වරම් ලැබුණේ විශ්වාසයේ ජීවිතයකට උපත ලැබීමට ය.

## පෙන්තකොස්ත දවසේ ශුද්ධාත්ම දානය



14.2 - අපොස්තුලුවරුන් වෙත ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කිරීම

සැඩ සුළඟක් හමන්නාක් වැනි හඬක් හදිසියෙන් අහසින් නික්මුණේ ය. ඔවුන් හිඳගෙන සිටි ගෙය මුළුමනින් ම එයින් පිරී ගියේ ය. ගිනි දලු වැනි දිව් බෙදී ගොස් ඔවුන් එකිනෙකා මත පිහිටනු ඔවුන්ට පෙනිණි. ඔවුහු සියල්ලෝ ම ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වී ආත්මයාණන් ඔවුන්ට දුන් කතා ශක්තිය ලෙස අන්‍ය භාෂාවලින් කතා කරන්නට පටන් ගත්හ.

(ක්‍රියා 2:2-4)

## අපෝස්තුලුවරු අන් අයට ශුද්ධාත්ම දනය

ප්‍රසාද ස්නාපනය සහ අභිවෘද්ධි ආලේපය සඳහා පිළිවෙත් දෙකක් අපෝස්තුලුවරුන්ගේ කාලයේ සිට පැවත ගෙන ආ බව පහත ශුද්ධ ලියවිලි පාඨ මගින් තහවුරු වේ.

> සමාරීයයන් දෙවියන් වහන්සේගේ වචනය පිළිගත් බව ජෙරුසලමේ සිටි ප්‍රේරිතවරයන්ට සැළ වූයෙන් ඔවුහු පේදුරු හා ජොහන් ඔවුන් වෙතට යැවූහ. ඔවුහු එහි ගොස් ඔවුන්ට ශුද්ධාත්මයාණන් ලැබෙන ලෙස යාච්ඤා කළහ. මන්ද ඔවුන් ජේසුස් වහන්සේගේ නාමයට බව්තීස්ම ස්නාපනය කරනු ලැබූවා මිස ඒ වනතුරුත් ශුද්ධාත්මයාණන් ඔවුන් කිසිවෙකු කෙරෙහි පැමිණ තිබුණේ නැත. ප්‍රේරිතවරුන් ඔවුන් පිට අත් තැබූ කල, ඔවුන්ට ශුද්ධාත්මයාණන් ලැබිණි.
>
> (ක්‍රියා 8:14-17)

> ඔවුහු ඒ අසා ස්වාමින් වන ජේසුස් වහන්සේගේ නාමයෙන් බව්තීස්ම-ස්නාපනය කරනු ලැබූහ. පාවුලු ඔවුන් පිට අත් තැබූ කල ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන් කෙරෙහි පැමිණි සේක. ඔවුහු අන්‍ය භාෂාවලින් කතා කරමින් දිවැස් වැකි පැවසූහ.
>
> (ක්‍රියාඃ 19:5-6)

> බව්තීස්ම-ස්නාපනය ද අත් තැබීම ද මළවුන්ගේ උත්ථානය ද සදාතන විනිශ්චය ද යන මේවා පිළිබඳ ඉගැන්වීම් ගැන නැවත වෙහෙසීමට උවමනාවක් නැත.
>
> (හෙබ්‍රෙව් 6:2)

ඔබ ශුද්ධාත්මයාණන් වහන්සේ ලබා ගැනීමට යන බැවින් දිනපතා ම ශුද්ධාත්මයාණන් වහන්සේට යාච්ඤා කරන්න. නිරතුරු ව ම ශුද්ධාත්මයාණන් වහන්සේගේ පිහිට අයදින්න. ඔබගේ ජීවිතයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ අත් දකින්න. යාච්ඤා කිරීමෙන් ශුද්ධාත්ම දීමනා අපට ලබා ගත හැකි වේ. අභිවෘද්ධි ආලේපය ලබා ගැනීම මගින් අප පරිණත කිතුනුවන් බවට පත් වේ.

**ක්‍රියාකාරකම**

1. ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ අපෝස්තුලුවරුන් තුළ ඇති වූ වෙනස්කම් මොනවා ද?
2. ශුද්ධාත්ම වරම් පතා යාච්ඤාවක් ලියන්න.

**ජීවිතයට බිඳක්**

***නිරතුරු ශුද්ධාත්ම වරම් පතා යාච්ඤා කරන්න.***